7

Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-02-17

පැමිණිලිකාරිය : එච්.බී වාසනා මිය,
අංක 319, 'කුසුම්සිරි'
හැඳල, වත්තල.

වගඋත්තරකරුවන් : 01 ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
වත්තල.

02 සභාපති,
ප්‍රාදේශීය සභාව,
හැඳල, වත්තල

<u>පැමිණිලි අංකය : HRC/3548/13</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, වරිපනම් අංක 125, මරදාන පාර, හැඳල වත්තල ලිපිනයැති තමාට අයත් පර්චර් 20 ක ඉඩමේ පාරට යාබද මායිමේ සිටුවා තිබූ මායිම් කණු කිසිදු මැනබැලීමකින් හෝ දැනුවත් කිරීමකින් තොරව ගලවා දමා පාරේ වතුර බැසයාම සඳහා තම ඉඩම තුළ පමණක් කාණු පද්ධතියක් ඉදිකිරීමට වගඋත්තරකාර ප්‍රාදේශීය සභාව විසින් කටයුතු කර ඇති බවයි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ලට අදාළව වාර්තාවක් ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, වත්තල, හැඳල මරදාන පාර වරිපනම් අංක 125 දරණ ඉඩම හා ප්‍රාදේශීය සභාවට අයත් මරදාන පාර අයිනේ ඉදිකර ඇති කාණුව 2013.07.30 දිනැති මාසික සභාවේ සම්මතය අනුව සිදුකර ඇති බවයි. මෙම මාර්ගයේ පළල අඩි 20, 19, 18 වන අතර, මෙම කාණුව ඉදිකර ඇත්තේ කොන්ක්‍රීට් මාර්ගයේ අයිනේ බවත් දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 2694924
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர்: 2689558
ක්ෂණික / துரித அழைப்பு: 2689064
වෙබ් / இணையம்: www.hrcsl.lk

එසේම වගඋත්තරකරුවන් පැමිණිලිකරුවන්ගේ මායිමට යොදා තිබූ කොන්ක්‍රීට් කණු කඩා ඉවත් නොකළ බවත්, පැමිණිලි පාර්ශවයට අයත් ඉඩමේ කොන්ක්‍රීට් යොදා නොමැති බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ලට අදාළව පළවන වගඋත්තරකාර වත්තල පොලිස් ස්ථානය මඟින් වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එකී වාර්තාවට අනුව පැමිණිලිකාරිය ඉහත කාරණයට අදාළව වත්තල ප්‍රාදේශීය සභාවට විරුද්ධව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, මෙම කාරණය සම්බන්ධයෙන් සිවිල් අධිකරණයේ නඩු පවරා විසඳා ගන්නා ලෙසට එහිදී පැමිණිලි පාර්ශවය වෙත උපදෙස් ලබා දී ඇති බවත්, සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරියගේ ඉඩමේ තිබූ මායිම් කණු ගලවා දමා කාණුවක් කපා කොන්ක්‍රීට් යෙදීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් වත්තල පොලිස් ස්ථානය වෙතද, පළාත් පාලන කොමසාරිස් වරයා වෙතද පැමිණිලි ඉදිරිපත් කර ඇති බව කොමිෂන් සභා පරීක්ෂණයේදී නිරීක්ෂණය වී ඇත.

එමෙන්ම වගඋත්තරකරුවන් විසින් එම ස්ථානයේ කාණුවක් කපා කොන්ක්‍රීට් කර ඇති බව පිළිගෙන ඇතත්, මායිම් කණු ගැලවීමක් සිදු නොකළ බවට කරුණු දක්වා ඇත.

නමුත් පැමිණිලි පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අදාළ ස්ථානයේ ලබාගත් ඡායාරූප අනුව එම ස්ථානයේ කොන්ක්‍රීට් කණු ගලවා දමා ඇති අයුරු නිරීක්ෂණය වේ. වගඋත්තරකරුවන් විසින් අදාළ මාර්ගය ප්‍රාදේශීය සභාව පවරා ගෙන ඇති බවට හෝ පාරේ පළල කොපමණද යන්න නිශ්චිතව සඳහන් කිරීමට අපොහොසත් වී ඇත. එමෙන්ම මාර්ගයේ පළල කොපමණද යන්න විමසීමේදී එක් එක් ස්ථානවල එක් එක් ප්‍රමාණයන් බව සඳහන් කර ඇත. එමෙන්ම මෙම මාර්ගයේ කාණුව සකසා කොන්ක්‍රීට් යෙදීම පැමිණිලිකාරියගේ ඉඩමට අදාළ කොටසේ පමණක් සිදුකර ඇති අතර, පැමිණිලිකාරියගේ ඉඩමට දෙපස ඇති මාර්ගය සඳහා එම කාණුව සැකසීම සිදුකර නොමැති බවට පැමිණිලි පාර්ශවය ඡායාරූපද සහතිව කොමිෂන් සභාව හමුවේ පෙන්වා දී ඇත.

එසේම පැමිණිලිකාරිය විසින් වත්තල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ලේදී, මෙය සිවිල් අධිකරණයක් හමුවේ නඩු පවරා සහන ලබා ගන්නා ලෙසට උපදෙස් ලබා ඇති බවට පොලිස් ස්ථානය වෙතින් ලබා දී ඇති වාර්තාවන්ට අනුව සඳහන් කර ඇත.

තවද මෙම කාරණය සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයා විසින්ද පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බවද කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී ඇත.

නිගමනය ඃ-

ඉහත කරුණු අනුව මෙය, වගඋත්තරකරුවන් විසින් කිසිදු සැළැස්මකින් තොරව අත්තනෝමතිකව සිදුකරන ලද ක්‍රියාවක් බවට නිරීක්ෂණය වී ඇති අතර, නීත්‍යානුකූලව ඔප්පු සහිත හිමිකම් කියනු ලබන බිම් කොටස් නීත්‍යානුකූලව පවරා ගැනීමකින් තොරව හා විධිමත් සැළසුමක් නොමැතිව කටයුතු කර ඇති බවද කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇත.

මේ අනුව වගඋත්තර පාර්ශවය විසින් මාර්ග සංවර්ධන කටයුතු සඳහා අදාළ ක්‍රියාවලීන් සිදුකළද එම කටයුතු නීතිමය රාමුවෙන් බැහැරව සිදුකර ඇති බවට අනාවරණය වී ඇති බැවින් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය ඃ-

> ඒ අනුව කාණු පද්ධතිය ඉදිකර ඇති පැමිණිලිකාරියට අයත් බිම් කොටස වන්දි මුදල් ගෙවා නිසි ක්‍රමවේදය අනුව පවරා ගැනීමට හෝ නොඑසේ නම් පැමිණිලිකාරියගේ භූමියට යොදා ඇති කොන්ක්‍රීට් කාණුව කඩා ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවට වගඋත්තරකාර ප්‍රාදේශීය සභාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

2016.03.21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

CHAIRMAN

Udagama

COMMISSIONERS

[signature]

Udagama

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/